GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2013/11/07

**මාධ්‍ය නිවේදනයයි**

**සීමාවාසික වෛද්‍යවරුන් සඳහා ශක්‍යතා වර්ධන වැඩසටහන " GOOD INTERN PROGRAMME"**

පස් අවුරුදු වෛද්‍ය උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු, වෛද්‍යවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචියට පෙර පැය 24ක සක්‍රිය කාලයක් වසරක් පුරා සීමාවාසික වෛද්‍යවරයෙකු ලෙස සේවය කල යුතුව ඇත. වෛද්‍ය සේවයේ ගුණාත්මකභාවය වැඩිකිරීම අරමුණ කරගනිමින් සීමා වාසික වෛද්‍යවරුන් ලෙස සේවය ආරම්භ කිරීමට ප්‍රථම, රෝහල තුල ඔවුන්ගේ කාර්‍යභාරය වඩාත් කාර්‍යක්ෂම හා ගුණාත්මක කිරීමේ අවශ්‍යතාවය රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය මගින් වසර ගණනක සිට අවධාරණය කරන ලදි. ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය, කොළඹ වෛද්‍ය පීඨ වෛද්‍ය අධ්‍යාපන ඒකකය වැනි ආයතන සමග එක්ව සීමාවාසික වෛද්‍යවරුන් සඳහා සම්පූර්ණ පුහුණු වැඩ සටහනක් ලබන 11 වෙනිදා සිට 14 වනදා දක්වා කාලය තුල කොළඹ ආනන්ද විද්‍යාලයේ කුලරත්න ශාලාවේ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මෙහිදී,

1. වෛද්‍යවරුන්ගේ දෙවන භාෂා හැකියාව වර්ධනය කිරීම.
2. අසාධ්‍ය රෝගින්ගේ හෘද හා ශ්වසන ප්‍රත්‍යානයනය පුහුණු වැඩසටහන (Cardiac Resuscitation)
3. රාජකාරී කාලය තුල මුහුණ දෙන වෛද්‍ය විද්‍යාත්මක හා සාමාජිය ගැටළු සඳහා පුහුණු වැඩසටහන සහ,

මීට සමගාමීව

1. සීමාවාසික වෛද්‍යවරුන් සඳහා අත් පොතක් සහ වෙබ් අඩවියක්ද අන්තර්ජාල පහසුකම් සඳහා පහසුකම් සැපයීමද මගින් සීමාවාසික වෛද්‍යවරුන්ගේ නොයෙකුත් වෛද්‍ය ක්ෂේත්‍රයන් පිලිබඳව දැනුම යථාවත් වීම සඳහා වැඩටහනක්ද,
2. තොරතුරු දැන්වීමේ ඒකකය හා ජාතික මට්ටමේ පර්යේෂණ පැවැත්වීම ආදි සම්බන්ධීකරණ වැඩසටහනක්ද,
3. කාර්‍යබහුල රාජකාරී කාලය තුල මානසික ආතතියෙන් තොරව රෝහල තුල ක්‍රියාත්මක වීමට මග පෙන්වන වැඩ සටහනක් ද ඇතුලු වැදගත් වැඩසටහන් 10ක් ද අන්තර්ග්‍රහනය කර ඇත.

මෙම වැඩසටහන වෛද්‍යවරයා වෙත පැමිණෙන රෝගින්, රෝහල් කාර්‍ය මණ්ඩලය, විශේෂඥ වෛද්‍යවරුන්, අනෙකුත් වෛද්‍යවරුන් සහ රෝහල් බලධාරින් සමග ඵලදායි සංන්නිවේදනයක් ඇති කිරීම, වෛද්‍ය වාර්තාවන් නිවැරදිව පවත්වාගෙන යාම, රාජකාරියට අදාල සාරධර්ම පවත්වා ගැනිම හා එමගින් වෛද්‍යවරයෙකු ලෙස ගුණාත්මක වූ වෛද්‍ය සේවයක් රටේ පුරවැසියන් වෙත ලබා දීමට අවස්ථාව සැලසේ යැයි රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය ලෙස අපි උදක්ම බලාපොරොත්තු වෙමු.

ස්තූතියි

Fr වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

| | | | |
|---|---|---|---|
| වැඩිදුර විස්තර - | වෛද්‍ය නවීන් සොයිසා | - | 0718582444 |
| | වෛද්‍ය සමීර සේනානායක | - | 0772928226 |